# ව්‍යාජ ජාතික ව්‍යාපාරයක ආරම්භය

වත්මන් ජාතික ව්‍යාපාරයෙහි ආරම්භය පංච මහා වාද සමග විශේෂයෙන් ම පාණදුරාවාදය සමග සම්බන්ධ වෙයි. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට එරෙහිව මායාදුන්නේ රජුගේ සිට පුරං අප්පු දක්වා අවුරුදු තුන්සිය පණහක් පමණ කාලයක් තිස්සේ ගෙන ගිය සටන් පාණදුරා වාදයෙන් අවසන් විය. ඉන්පසු ආරම්භ වූයේ අළුත් ම යුගයකි. මේ වෙනස තේරුම් නොගෙන ජාතික ව්‍යාපාරයෙහි වත්මන් ව්‍යාකූලත්වය අවබෝධකරගත නො හැකි ය. ඒ වෙනස කුමක්දැයි අපි පසුව සාකච්ඡා කරමු.

එයට පළමුව ජාතික ව්‍යාපාරයේ පසුගිය දශක එකහමාරක දෙකක පමණ කෙටි කාලය ගැන වචනයක් දෙකක් කිව යුතු ය. එහෙත් ඒ සඳහා ද පළමුව අවුරුදු සියයකට වඩා අතීතයට යා යුතු ව ඇත. පාණදුරාවාදයෙන් පසුව ජාතික ව්‍යාපාරයේ ප්‍රභේද දෙකක් දක්නට ලැබිණි. එක් ප්‍රභේදයක් ටික කාලයක් අනගාරික ධර්මපාල ව්‍යාපාරය වශයෙන් පැවතිණි. අනෙක් ප්‍රභේදය මූල (ප්‍රොටෝ) එ ජා පක්ෂයේ ජාතික ව්‍යාපාරය ලෙස හැඳින්විය හැකි ය. ඕල්කට්තුමා මේ දෙවැනි ප්‍රභේදයෙහි දේව පියා (ගෝඩ් ෆාදර්) විය. මා මෙහි දී දේව පියා යන ක්‍රිස්තියානි සංකල්පය යොදා ගන්නේ ජාතික ව්‍යාපාරයට ඇතුල් වූ බටහිර ක්‍රිස්තියානි සංකල්ප ඒ දෙවැනි ප්‍රභේදයෙහි ක්‍රියාත්මකවීම සවිඥානිකව සංකේතවත්කිරීමේ අරමුණ ද ඇතිව ය. මේ දෙවැනි ප්‍රභේදය කල්යෑමේ දී එ ජා ප විසින් මෙහෙයවනු ලබන ජාතික ව්‍යාපාරය බවට පත්විණි. එය ව්‍යාජ ජාතික ව්‍යාපාරයක් බව පසුව තේරුම්ගැනීමට හැකිවනු ඇත.

දෙවැනි ප්‍රභේදය හා පළමු ප්‍රභේදය අතර වෙනස්කම් මුල සිට ම දක්නට ලැබිණි. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් හා අනගාරික ධර්මපාලතුමන් සහ ඕල්කට්තුමා අතර මතභේද ඇතිවිය. පාණදුරාවාදයෙන් හා ඕල්කට්තුමාගෙන් පසුව මෙරට එතෙක් නොසිටි බෞද්ධයන් පිරිසක් ඇතිවූහ. ඔවුන් ගැන කලින් සඳහන්කර ඇත. පාණදුරාවාදය ගැන කියැවෙන විට ඔවුන් පිළිබඳ තවත් විස්තර කෙරෙනු ඇත. මේ පිරිස ඕල්කට් බෞද්ධයෝ වෙති. ජාතික ව්‍යාපාරයේ දෙවැනි ප්‍රභේදයට නගරවල ආකර්ෂණයක් තිබුණු අතර එය වඩාත් බලවත් විය. ආර්ථික මෙන්ම දේශපාලන වශයෙන් ද ඔවුහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය සමග සිටියහ. පළමු ප්‍රභේදය ගම්වල සාම්ප්‍රදායික සිංහල බෞද්ධයන් අතර ජනප්‍රිය විය. පළමු ප්‍රභේදය සඟ, වෙද, ගුරු යන කණ්ඩායම් වටා එක් රොක් විණි නම් දෙවැනි ප්‍රභේදය ඉංගිරිසින් විසින් ඇතිකරන ලද වෘත්තීන් වූ බටහිර වෛද්‍ය (දොස්තර), නීතිඥ, පසු කලෙක ඉංජිනේරු හා බුද්ධිමතුන් යැයි හැඳින්වෙන පිරිස, ව්‍යාපාරික පිරිස සහ ඒ ප්‍රභූ පිරිස් යන එන පන්සල්වල භික්ෂූන් වහන්සේ වටා පෙළගැසිණි. (අද සිදුවන්නේ කුමක් දැයි මේ අනුව කල්පනාකරගත හැකි ය. වීරවිදාහන, ජයග්‍රහණය හා ජාතික සංඝ සභාව වැනි සංවිධාන ගැන සිතන්න.) වැඩිකල් යෑමට මත්තෙන් දෙවැනි ප්‍රභේදය විසින් පළමුවැනි ප්‍රභේදය පරාජයට පත්කරනුව ලැබිණි. දෙවැනි ප්‍රභේදය පිටුපස සිට සේනානායකවරු නායකත්වය ගත්හ. මුල් අවස්ථාවේ දී ඩී. බී. ජයතිලක මහතා මේ ප්‍රභේදයෙහි නායකයා ලෙස සැලකිණි. එකල ප්‍රභේද දෙක අතර පැහැදිලි වෙනසක් නොතිබූ බැවින් ජයතිලක මහතා නායකත්වයට පත්කරගැනීම මගින් පළමුවැනි ප්‍රභේදය යම් ආකාරයකට නොමග යැවීමට ද දෙවැනි ප්‍රභේදයට හැකිවිය. ඩී. බී. ජයතිලක මහතා යොදාගෙන අනගාරික ධර්මපාලතුමා පරාජය කළ දෙවැනි ප්‍රභේදය වැඩිකල් නොගොස් ජයතිලක මහතා ද ඉන්දියාවට තල්ලු කෙළේ ය. ඉන්පසු සේනානායකවරු නිල වශයෙන් ම දෙවැනි ප්‍රභේදයෙහි නායකත්වයට පත්වූහ. දෙවැනි ප්‍රභේදය පළල් ජාතික ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක නො වී ය. එය හුදෙක් එ ජා පක්ෂයෙහි බෞද්ධකමට නැඹුරු වූ පිරිසක් විසින් ගෙනයන ලද ව්‍යාපාරයක් විය. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි ගැත්තන් වූ මොවුහු බෞද්ධකම හරහා ජාතික ව්‍යාපාරයක් මවාපෑමට සමත්වූහ.

රටේ ජාතිකත්වය අගය කළ සාමාන්‍ය ජනතාවගෙන් යම් පිරිසක් ද, විශේෂයෙන් ම භික්ෂූන් වහන්සේ ද මේ නායකත්වය වටා පෙළ ගැසුණේ අවබෝධයකින් නො වෙයි. 1915 දී සිදු වූ සිංහල මුස්ලිම් අරගලය සිංහල මුස්ලිම් යනුවෙන් නොව බෞද්ධ මුස්ලිම් යනුවෙන් හඳුන්වනු ලැබීම නිවැරදි වන්නේ එහි දී නායකත්වය දුන් පිරිස ද සැලකිල්ලට භාජනය කිරීමෙන් ය. මේ ප්‍රභේදය එ ජා පක්ෂය විසින් මෙහෙයවෙන ව්‍යාජ ජාතික ව්‍යාපාරය බවට පසුව පත්විය. අපි එය ඕල්කට් බෞද්ධ ව්‍යාපාරය ලෙස හඳුන්වමු. එය ජාතික ව්‍යාපාරයක් ලෙස හැඳින්වීමට නොහැකි ප්‍රධාන ම කරුණ නම් එය අධිරාජ්‍ය විරෝධී නොවීම ය.

© Prof. Nalin De Silva

අනගාරික ධර්මපාලතුමාගෙන් පසුව යටපත්වී තිබුණු ජාතික ව්‍යාපාරයේ පළමු ප්‍රභේදය ලංකා සමසමාජ පක්ෂය පිහිටුවීමෙන් පසුව තවදුරටත් අතරමං විය. ජාතික ව්‍යාපාරයක් අනිවාර්යයෙන් ම අධිරාජ්‍ය විරෝධී විය යුතු ය. එමෙන් ම එහි ජාතිකත්වයක් තිබිය යුතු ය. සමසමාජ පක්ෂය අධිරාජ්‍ය විරෝධී විය. එහෙත් එය අධිරාජ්‍ය විරෝධී වූයේ ජාතිකත්වය පදනම්කරගනිමින් නොව බටහිරයන් විසින් ම නිර්මාණය කරන ලද මාක්ස්වාදය පදනම් කරගනිමිනි. මාක්ස්වාදය ජාතිකත්වයට එරෙහි විය. එය බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයටත් වඩා මධ්‍යකාලීන යුරෝපීය කතෝලික චින්තනය මත පදනම් වූ ද යුදෙව් ක්‍රිස්තියානි සභ්‍යත්වයක ජනිතවූ ද දැනුම් පද්ධතියක් විය. එය ධනේශ්වර ආර්ථිකයට විරුද්ධ විය. එහෙත් යුදෙව් ක්‍රිස්තියානි සභ්‍යත්වයට විරුද්ධ නො වී ය. මාක්ස්වාදය ලංකාවට හඳුන්වාදීමෙන් පසු සමසමාජ පක්ෂයේ මේ දෙබඩි ස්වභාවය හේතුකොටගෙන මෙරට ජාතික ව්‍යාපාරය අතරමංවිය. (සමසමාජ පක්ෂයේ දෙබඩි ස්වභාවයට අනුව එය අධිරාජ්‍යවාදී ආර්ථිකයට හා දේශපාලනයට ඉතා පටු අර්ථයකින් විරුද්ධ විය. මෙයින් අදහස් කෙරෙන්නේ සඩමසමාජ පක්ෂය බටහිර නූතනත්වය විසින් හඳුන්වාදෙනු ලැබූ ආර්ථිකයේ සියළු අංගවලට හෝ දේශපාලන ව්‍යූහවල සියළු අංගවලට හෝ විරුද්ධ වීය යන්න නො වෙයි. මාක්ස්වාදය විසින් ධනවාදය ද සැලකෙන්නේ සමාජවාදයට යන ගමනේ - සමාජ විකාශයේ - එක් පියවරක් ලෙස ය. අනෙක් අතට සමසමාජ පක්ෂය බටහිර නූතනත්වයේ යුදෙව් ක්‍රිස්තියානි සභ්‍යත්වය පැතිරවීම සඳහා පෙනී සිටියේ ය.) ජාතිකත්වය අගය කළ විශාල පිරිසකට සමසමාජ පක්ෂයේ අධිරාජ්‍ය විරෝධී ස්වරූපය හමුවේ වුව ද ඒ පක්ෂයෙන් ඈත්වී සිටීමට සිදුවිය. එමෙන් ම සමසමාජ පක්ෂයේ ජාතිකත්වයක් නොතිබූ හෙයින් ඕල්කට් බෞද්ධ ව්‍යාපාරයට, එනම් ව්‍යාජ ජාතික ව්‍යාපාරයට ජනතාව මුළාකර ඔවුන් සමසමාජ පක්ෂයට එරෙහිව මෙහෙයවීමට හැකිවිය. ඕල්කට් බෞද්ධ ව්‍යාපාරය සමසමාජ පක්ෂයට විරුද්ධව ජනතාව මෙහෙයවූයේ බුද්ධාගම මුල්කරගෙන වීමෙන් ය යන්න මෙහි දී කැපී පෙනෙන කරුණ වෙයි. සමසමාජයෙන් බුද්ධාගම බේරාගැනීමට ඉදිරිපත්වූවෝ බටහිර ක්‍රිස්තියානි අධිරාජ්‍යවාදයට කත් ඇදි, එහි සුවච කීකරු නිවට සේවකයන් වූ එ ජා පාක්ෂිකයෝ ය. ඔවුහු සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූහ. ආගමින් ඕල්කට් බෞද්ධ වූහ.

ශ්‍රී ල නි පක්ෂය බිහිවූයේ මෙවන් පසුබිමක ය. අප බොහෝ අවස්ථාවල පෙන්වා දී ඇති පරිදි ඒ පක්ෂය බිහිවූයේ ලිබරල් පක්ෂයක් ලෙස ය. එහෙත් සිංහල බෞද්ධයන්ගේ අවශ්‍යතාවය පරිදි වැඩිකල් නොගොස් එය රූපාන්තරකරණයවී ජාතිකත්වයේ පක්ෂය බවට පත්විය. විප්ලවකාරී සමසමාජ පක්ෂය නමින් පෙනී සිටි සමසමාජ කණ්ඩායමට ද සිංහල බෞද්ධයන්ගේ ජාතික හඬට පිටුපෑමට නොහැකි විය. මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ 1956 ය. ගුණදාස අමරසේකර මහතා පළමු වතාවට පෙන්වා දී ඇති පරිදි 1956 යනු අනගාරික ධර්මපාලතුමාගේ ව්‍යාපාරය නැවත මතුවීමක් විය. අනගාරික ධර්මපාලතුමාගේ ව්‍යාපාරය සමස්තයක් ලෙස ගත්කල අධිරාජ්‍ය විරෝධී විය. තැනක දෙතැනක වැරදි සිදුවී ඇති නමුත් අප සැලකිය යුත්තේ සමස්තය ය. එමෙන් ම ඉතා පැහැදිලිව ම අනගාරික ධර්මපාල ව්‍යාපාරය ජාතික ව්‍යාපාරයක් විය. එය සිංහල බෞද්ධ මිස ජාත්‍යන්තර බෞද්ධ නො වී ය. ඕල්කට් බෞද්ධයන්ගේ අවශ්‍යතාවයට ක්‍රිස්තියානි සංගම් හා සංවිධාන අනුකරණය කරමින් විවිධ බෞද්ධ සංගම් හා සම්මේලන ඇතිවීමට පෙර ම එතුමා සිංහල බෞද්ධයා පුවත්පත ආරම්භ කෙළේ ය. 1956ට නායකත්වය දුන්නෝ ජාතිකත්වය අගය කළ අධිරාජ්‍ය විරෝධී භික්ෂූන් වහන්සේ, එලෙස ම අධිරාජ්‍ය විරෝධී වූ ද ජාතිකත්වයක සිටියාවූ ද, ගුරුවරු හා වෙදමහත්වරු වූහ. ම ඒ පෙ බලයට පත්වූ 1956 ගැන සිද්ධියෙන් පසුව බමුණු කුලය බිඳවැටීමක් ගැන මාර්ටින් වික්‍රමසිංහ මහතා ලියුව ද 1956ට බල පෑ සාහිත්‍යය නිර්මාණය කෙළේ ඒ මහතා නොව පියදාස සිරිසේන මහතා ය. අනගාරික ධර්මපාලතුමාගේ ව්‍යාපාරය බලපෑවේ පියදාස සිරිසේන මහතාට මිස මාර්ටින් වික්‍රමසිංහ මහතාට නොවන බව ද මෙහි දී සඳහන් කළ යුතු ය.

© Prof. Nalin De Silva